# උතුරු මැද පළාතේ වැව් පරිසර පද්ධතිය ආශ්‍රිතව පවතින කට්ටකඩුව වියැකී යාමේ බලපෑම

*එස් එම් එල් එන් කුමාරි[1] ඩබ්ලිව් ඒ ඩී නිමේෂා[2] ඩබ්ලිව් අයි කේ එන් ප්‍රනාන්දු[3]*
*ඩබ්ලිව් අයි කේ එන් ආර් විජේසිංහ[4]*

මෙම පර්යේෂණ නිබන්ධය වැව සුරැකීම සඳහා පවතින කට්ටකඩුව විනාශ වීම පිලිබද සිදුකරන පර්යේෂණ විවරණයකි.කට්ටකඩුව යනු වැ කන්දට පිටත පාදයේ සිට ඊට ඉහල වෙල් පන්තියේ ඉහළම වගා බිම් අතර පවතින බිම් කොටසකි.වර්තමානයේ උතුරු මැද පළාතේ වැව් තුල  කට්ටකඩුව දුලබ දසුනක් වී ඇති අතර වාරි ඇළ මඟින් කුඹුරට සෘජුවම ජල සම්පාදනය කරනු ලබයි.මෙය විවිධ වූ ජෛව විවිධත්වයෙන් යුත් පරිසර පද්ධතියකි.මෙහි පවතින ශාක මානවයාගේ ඖෂධ ,ආහාර, දැව ආදී විවිධ අවශ්‍යතා පූර්ණය කරන අතර සත්ව විශේෂ රැසකට වාසස්ථාන සපයන ලබයි .එමෙන්ම භූගත ජල මට්ටම එසවීම මගින් වැව් බැම්මෙන් සිදුවිය හැකි කාන්දු වීම අවම කරන අතර කුඹුරු වලට ලවණ යකඩ ඇතුළු වීම වළක්වයි.යතෝක්ත පර්යේෂණ ගැටලුව සාධනය කර ගැනීම සඳහා ක්‍රමවේදය ලෙස ප්‍රාථමික දත්ත සහ ද්විතීක දත්ත යොදා ගන්නා ලදී. මිහින්තය වැවෙහි ක්ෂේත්‍ර අධ්‍යයනයක් මෙන්ම  පොත් සහ සඟරා,අන්තර්ජාලය මගින් දත්ත එක් රැස් කර ගන්නා ලදී.මෙහිදී කට්ටකඩුව  විනාශ වී යාමේ බලපෑම විමසීම අරමුණ වශයෙන් තබා පර්යේෂණ අධ්‍යනය සිදු කරන ලදී.ගොවියන් කට්ටකඩුව නැමැති වැව් රක්ෂිතයේ  ද වී  වගාව සිදුකිරීමත් වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ දී සහ විවිධ සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීමේදී නිවැරදි  ක්‍රම යොදා නොගැනීම නිසාත් උතුරු මැද පළාතේ කට්ටකඩුව නැමැති වැව් රක්ෂිතය  බහුලව විනාශ වී ගොස් ඇත.එබැවින් කට්ටකඩුවෙහි නැවත ශාක රෝපණය කර කට්ටකඩුව නැවත ප්‍රතිස්ථාපනය කිරීම මෙහි ප්‍රතිඵලය ලෙස බලාපොරොත්තු වේ

**මුඛ්‍ය පද -** *වැව, පරිසර පද්ධතිය, ශාක, සාධනය, කට්ටකඩුව*

[1] සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය lalaninishakumari3@gmail.com
[2] සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
[3] සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය fkrishufdo@gmil.com
[4] සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය